# 1.24 ආධාරක පංතිවල ගුරුවරුන්ගේ ඉගැන්වීමේ ක්‍රමවලින් සිංහල භාෂාවට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

අනුරින් ඉන්දිකා දිවාකර
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

## ABSTRACT

ශ්‍රී ලාංකිකයන් වැඩි පිරිසක් භාවිත කරන ප්‍රධාන භාෂාව වන්නේ සිංහල භාෂාවයි. එසේ වුව ද භාෂාව භාවිතයේ දී වැඩි පිරිසකට පැන නැගී ඇත්තේ ගැටලු සහගත බවකි. ඒ සඳහා හේතුවන ප්‍රධාන අංශයක් වන්නේ ආධාරක පංතිය. මේ පර්යේෂණ පත්‍රිකාවට පාදක කරගනු ලැබුවේ අ: පො: ස: උසස් පෙළ විභාගයට සිංහල විෂය උගන්වන ගුරුවරුන් හා සිංහල විෂය හදාරණ ශිෂ්‍යය ශිෂ්‍යයාවන්ය. ඒ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ආධාරක පංති සමහරක් තෝරා ගන්නා ලදී.

ආධාරක පංති මගින් සිංහල භාෂාවට සිදුවන අහිතකර බලපෑම ප්‍රධානාංශ දෙකක් යටතේ අනාවරණය විය. ඒ ගුරුවරුන්ගෙන් ඇතිවන අහිතකර බලපෑම හා ශිෂ්‍යයන්ගෙන් ඇතිවන අහිතකර බලපෑමය. මෙහි දී ගුරුවරුන්ගෙන් සිංහල භාෂාවට ඇතිවන අහිතකර බලපෑම පිළිබඳ ව කරුණු ඉදිරිපත් කෙරේ. මෙය **ඉගැන්වීමේ ක්‍රම** හා **ගුරුවරුන්ගේ ඌනතා** වශයෙන් වෙන්කොට දැක්විය හැකිය. **ඉගැන්වීමේ ක්‍රම** පිළිබඳ ව කරුණු දැක්වීම මෙහි මුඛ්‍යාභිමතාර්තයයි. ඒ අනුව විෂය නිර්දේශයට අමතර කරුණු ඉගැන්වීම, අනුමාන ප්‍රශ්න හා උත්තර ලබාදීම හා කටපාඩම් කරවීම, නිර්මාණශීලීව යමක් ලිවීමට හුරු නොකිරීම, විෂය කරුණු නිසි ලෙස අධ්‍යයනයට හුරු නොකිරීම, ප්‍රායෝගිකව ශිෂ්‍යයන් ලවා භාෂාව භාවිත නොකිරීම, එක් එක් ශිෂ්‍යයන් කෙරෙහි හෝ ශිෂ්‍ය කණ්ඩායම් හෝ ගෙන ඔවුන් පිළිබඳ සොයා බැලීමක් සිදු නොකිරීම, තමන් උගන්වන කරුණු පමණක් විභාග ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සුදුසු බව තහවුරු කිරීම, ශිෂ්‍යයන්ට ඉගැන්විය යුතු ප්‍රමාණය පිළිබඳ නොසිතා අනවශ්‍ය කරුණු ඉගැන්වීම ආදි කරුණු ඒ අතර ප්‍රධාන වේ.

මේ නිසා ඇතිවන ප්‍රතිඵලය වන්නේ සමාජයට මුදා හරිනු ලබන සාමාජිකයන්ගෙන, සමාජයට අවශ්‍ය කරනු ලබන, සිංහල භාෂාව පිළිබඳ ව දැනුම ප්‍රමාණවත් අයුරින් නොලැබීමයි. භාෂාව අවබෝධ කරගැනීම, හැසිරවීම, ඉදිරිපත් කිරීම, භාවිතය සම්බන්ධයෙන් ඔවුන්ට ඇතිවන්නේ ගැටලු සහගත බවකි. එසේ ම සමාජ වගකීම් දරන බොහෝ දෙනෙකුගේ ම චින්තනය, නිර්මාණ හැකියාව, රස වින්දනය පුළුල් පරාසයක් කරා විහිදී නොයන අතර සමාජ ප්‍රශ්නවලට මධ්‍යස්ථ ව මුහුණ දීමේ හැකියාව ද ඔවුන් සතු නොවීමයි.